# 2.18 ලම්බකර්ණ වංශයේ ප්‍රභවය පිළිබඳ ඇති මතවාද විමර්ශනය කිරීම

අනුරුද්ධිකා දිල්හානි
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ලංකා ඉතිහාසයේ රාජ්‍ය පාලනය ගෙනගිය පාලකයන් පිළිබඳව සලකා බලන කල්හි ඔවුහු ලම්භකර්ණ වංශයට හෝ මෞර්ය වංශයට හෝ අයත් වූහ. ප්‍රථමයෙන් ම ලම්බකර්ණ රාජවංශයක් ගැන අපට අසන්නට ලැබෙන්නේ වසභ රජු දවස වුව ත් ලම්බකර්ණයන් ඊට පෙර සමාජයේ සිටි බවට ත්, ඔවුන් කිසියම් උසස් සමාජ තත්ත්වයන් ඉසිළූ බවටත් සාධක තිබේ.

මෙරට පාලනය ගෙනගිය බොහෝ පාලකයෝ තමන් ක්ෂත්‍රීය වංශයට අයත් බව පෙන්වීමට නිරන්තරයෙන් උත්සාහ ගත්හ. මේ නිසාම බොහෝ රජවරුන් තමන් බුදුන් වහන්සේට ඥාතීත්වයක් ඇති බව පෙන්වීමට ද පණ්ඩුවාසුදේව, භද්දකච්චායනා තමන්ගේ ආදී මුත්තන් බව පෙන්වීමට ද උත්සාහ දරා ඇත. ලම්බකර්ණයන්ගේ ප්‍රභවය පිළිබඳව විමසීමේදී මොවුන් ක්ෂත්‍රීය වංශයට අයත් ද වෛශ්‍යය වංශයට අයත් ද යන්න පිළිබඳව මතවාද කිහිපයක් පවතී. පැරකුම්බා සිරිත, පූජාවලිය හා මහා බෝධිවංසයට අනුව ලම්බකර්ණයන් අශෝක රජුගේ මෞර්ය වංශයට අයත් බව පෙන්වා දී ඇත. නමුත් මහාවංසයේ ඔවුන් ක්ෂත්‍රියයන් ද වෛශ්‍යයන් ද යන්න සඳහන් කර නොමැත.

ලම්බකර්ණයන් ගැන අපට අසන්නට ලැබෙන්නේ ඉළනාග රජු දවස ය. මේ රාජ්‍ය වංශයේ ආරම්භකයා වූයේ වසභ ය. (ක්‍රි 67-111) නමුත් වසභට පෙරාතුව ද ලංකාවේ විවිධ ප්‍රදේශවල ලම්බකර්ණයන් සිටි බවට තොරතුරු ලැබේ. ජය ශ්‍රී මහා බෝධිය රැක බලාගැනීම සඳහා අටළොස් ශ්‍රේණි එවන ලද අතර එම පිරිස් සමඟ සුමිත්ත කුමරු ආ බව ත් ඔහුගෙන් ලම්බකර්ණයන්ගේ ප්‍රභවය ඇති වූ බව ත් කියැවේ. කෙසේ නමුත් මේ වංශයේ ප්‍රභවය පිළිබඳ මතවාද තිබේ. ප්‍රාථමික මූලාශ්‍රය හා විද්වතුන්ගේ අදහස් අධ්‍යයනය කරමින් ලම්බකර්ණයන්ගේ ප්‍රභවය පිළිබඳ ඇති අදහස් විමර්ශනය කිරීම මේ අධ්‍යයනය තුළින් සිදු කෙරේ.

මෙහිදී නිගමනය කළ හැක්කේ සංඝමිත්තා තෙරණිය සමඟ ශ්‍රී මහා බෝධිය වැඩම වූ අවස්ථාවේදී පැමිණි සුමිත්ත කුමරු ඇතුළු සෙසු කුමාරවරුන් මගින් ලම්බකර්ණ වංශය ආරම්භ වූ බවය. ඒ අනුව මොවුන් වෛශ්‍ය කුලයට අයත් බව තහවුරු වේ. පළමුවෙන් ම වාර්තා තබන්නන් ලෙස පරිපාලන ක්ෂේත්‍රයට දායක වූ මොවුහු පසුව වෙනම ම රාජ වංශයක් බිහිකිරීමට තරම් ශක්තිවන්ත වූහ. මේ ආකාරයට ලංකා දේශපාලනය හා ආර්ථික හා සාමාජීය යන අංශවල පරිවර්තනීය අවධියක් සනිටුහන් කළ රාජ වංශයක් ලෙස ලම්බකර්ණයන් සැලකිය හැකිය.

**මුඛ්‍ය පද** - ලම්බකර්ණ වංශය, ක්ෂත්‍රීයය වෛශ්‍යය,